


LAKE HOUSE

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යාපන සේවය සහ දිනමිණ පුවත්පත ඒකාබද්ධව කෙරෙන බුද්ධි ප්‍රබෝධය අධ්‍යාපනික සද්කාරය.

# දේශපාලන විද්‍යාව

- මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් සහ B කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්ත වේ.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සැපයිය යුතුයි.
- එක් පිළිතුරකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 100 කි.

## A කොටස

- අංක 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.

1)දේශපාලන විද්‍යා අධ්‍යයනයේ සාම්ප්‍රදායික තේමාවන් වන්නේ,

1.රාජ්‍යය හා ආණ්ඩුව ඇතුළු දේශපාලන ආයතන
2.දේශපාලන න්‍යාය හා දර්ශනය
3.දේශපාලන චින්තනය හා දේශපාලන මතවාද
4.දේශපාලන බලය හා බල අරගලයන්හි ස්වභාවය
5.දේශපාලන සංස්කෘතිය හා දේශපාලන සමාජානුයෝජනය

2)දේශපාලනය,
1.දේශපාලන පක්ෂ හා දේශපාලඥයින් ප්‍රධාන රඟුම්කරුවන් වේ.
2.දේශපාලන දාර්ශනිකයන් හා චින්තකයින්ගේ භූමිකාව වැදගත් වේ.
3.සම්පූර්ණයෙන්ම ප්‍රායෝගික ක්‍රියාවලියකි.
4.දේශපාලන අරගලය ජාතික වශයෙන් පමණක් නොව, අනතර්ජාතික වශයෙන්ද ක්‍රියාත්මක වේ.
5.රාජ්‍ය බලය ඉක්මවා යන සමාජ ක්‍රියාවලියක් වේ.

3)දේශපාලන විද්‍යාව සමාජ විද්‍යාවක් ලෙස සැලකෙන්නේ,

1.එය විද්‍යාගාර පර්යේෂණයන්හි ප්‍රතිඵලයක් නිසාය.
2.එය පුද්ගල චර්යාව අධ්‍යයනය කරන්නක් වීම නිසාය.
3.එය ගතික විෂයක් ලෙස පිළිගැනෙන නිසාය.
4.විෂය ක්ෂේත්‍රය කාලානුරූපව වෙනස්වීම්වලට බඳුන්වන නිසා.
5.අනෙකුත් සමාජ විද්‍යාවන් සමඟ දක්වන සමීප සබඳතාවන් නිසා.

4)ග්‍රීක පෞර රාජ්‍ය ක්‍රමය,

1.ග්‍රීකයේ සෑම නගරයක්ම පදනම් කරගෙන බිහි විය.
2.සමාජ ක්‍රමය ප්‍රධාන පන්ති තුනක් පදනම් කරගෙන ක්‍රියාත්මක විය
3.ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ ලෙස රාජ්‍ය පාලන කටයුතු වෙන් කරන ලදී.
4.ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක විය
5.දේශපාලන බලය හිමි වූයේ රදලයන් හා වහල් හිමියන්ට පමණි

5) ජාතික රාජ්‍යන්හි නැගී ඒම හා ඍජුවම සම්බන්ධ වූ කරුණකි,

1.ශුද්ධ රෝමානු අධිරාජ්‍ය බිඳවැටීම.
2.ප්‍රොතෙස්තන්ත ආගමික ප්‍රතිසංස්කරණ
3.ස්වාධිපත්‍යය සංකල්පය
4.රජවරුන්ගේ දිව්‍යමය අයිතිවාසිකම් පිළිබඳ සංකල්පය.
5.දාර්ශනිකයන්ගේ වන දේශපාලන චින්තනය

6)ස්වාධිපත්‍ය න්‍යාය,

1.ජාතික රාජ්‍යයේ බලය පිළිබඳ විග්‍රහ කරන දේශපාලන සංකල්පයකි.
2.ඒකීය,බෙදිය නොහැකි,පැවරිය නොහැකි බලයක් ලෙස සැලකේ.
3.යුරෝපයේ පැවතා වැඩවසම් රාජ්‍ය ක්‍රමය වෙනුවට විකල්ප රාජ්‍ය ක්‍රමයක් ගොඩනගා ගැනීමේ අරමුණින් ඉදිරිපත් කෙරුණි.
4.ප්‍රමුඛ න්‍යායධරයා ජීන් බෝඩැන්ය.
5.අන්තර්ජාතික මූල්‍ය ආයතනවල නැගී ඒම ස්වාධිපත්‍ය සංකල්පය ශක්තිමත් වීමට ඉවහල් විය.

7)ජෝන් ඔස්ටින්ට අනුව නීතියක් බලාත්මක වීමට නම්,

1. ජනතා අභිමතය නිර්නය විය යුතුය.
2.ස්වාධිපති බලය පදනම් කරගත් දෙයක් විය යුතුය.
3.ස්වාධිපතිගේ නියෝගයක් විය යුතුය.
4.අවනත නොවන විට බලය යොදා අවනතභාවය ලබා ගැනීමට හැකිවිය යුතුය.
5.නීතිය යටතේ ප්‍රශ්න කිරීමකින් තොරව අවනත විය යුතුය.

8)ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක මූලිකාංගවලට අදාළ වන්නේ,

1.ව්‍යවස්ථානුකූලවාදය.
2.නිදහස් හා සාධාරණ මැතිවරණ
3.විධායකය විසින් නීති හැසිරවීම.
4.බහු පක්ෂ ක්‍රමය.
5. නිදහස් ජනමාධ්‍යය.

9)සමාජවාදී දේශපාලන ක්‍රමයක මූලික ලක්ෂණ වන්නේ,

1. සාමූහික දේපල ක්‍රමය හා සමාජ අවශ්‍යතා පදනම් කරගත් ලාභ ඉපයීමේ චේතනාවෙන් විග්‍රහ කරන නිෂ්පාදන ක්‍රියාවලිය
2.පෞද්ගලික නිදහස සහතික කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක පැවැත්ම.
3.කොමියුනිස්ට් පක්ෂයේ ආධිපත්‍යයට හසුවූ ව්‍යවස්ථාදායකය , විධායකය හා අධිකරණය.
4.රාජ්‍ය, ආණ්ඩුව හා පක්ෂ වෙන් කළ නොහැකි ලෙස බැඳී තිබීම.
5.ආර්ථික සමානාත්මතාවය වෙනුවෙන් දේශපාලන නිදහස කැපකිරීම.

10)ඒකීය ආණ්ඩු ක්‍රමයක,

1.තනි මධ්‍යම ආණ්ඩුවක් බලය භුක්ති විඳී.
2. එකම රට තුළ ද්විත්ව පුරවැසි බවක් ඇත.
3.ආණ්ඩුවේ බලය ප්‍රාදේශීයව බෙදා නැත.
4.ප්‍රාදේශීය ව්‍යවස්ථාදායකයන්ගේ නියෝජිතයන් මධ්‍යම ව්‍යවස්ථාදායකයට තෝරා ගනී.
5.ස්වාධිපති බලය බෙදී නැත.

11)සන්ධීය ආණ්ඩු ක්‍රමයක,

1.ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇත.
2.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍ය වේ.
3.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බලතල පංගු කර නැත.
4.බහුවිධතාවය සහිත රටකට වඩාත් ප්‍රයෝජනවත් වේ.
5.ද්වීමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් දැකිය හැකිය.

12)ද්වි පක්ෂ ක්‍රමය,

1.දේශපාලන ක්‍රමය තුළ ආධිපත්‍යධාරී භූමිකාවක් ඉටුකරන පක්ෂ දෙකක් පමණක් ඇති බව ඉන් හැඟවේ.
2.සජාතීය සමාජයක පැවැත්ම ද්විපක්ෂ ක්‍රමයක් පැන නැගීමට බලපාන ප්‍රබල සාධකයකි.
3.ආණ්ඩු පිහිටුවීම පහසු කරයි.
4.අගමැතිවරයාගේ තත්ත්වය ශක්තිමත් කරයි.
5.බහුතර පක්ෂයේ ආඥාදායකත්වයක් ඇතිවීම වළක්වයි.

13)බලපෑම් කණ්ඩායම්,

1.ආණ්ඩුවේ බලය ක්‍රියාත්මක කිරීමේ කාර්යයට නිල වශයෙන් දායක වේ.
2.සිය ආර්ථික අවශ්‍යතා අනුව දේශපාලන ප්‍රතිපත්ති සකස් කර ගනී.
3.රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා තොරතුරු සපයනු ලැබේ.
4.ආර්ථික ආශාවනගෙන් පරිභාහිරවද බලපෑම් කණ්ඩායම් ඇතිකර ගනී.
5.පෞද්ගලික ආශාවන් මෙන්ම පොදු අරමුණු ඉටු කර ගැනීම සඳහා ද ඒකරාශී වේ

14)මහජන මතය,

1.පොදු කරුණු ගැන ජනතාව තම මතය ප්‍රකාශ කරන මාධ්‍ය වේ.
2.ආණ්ඩුවේ ජනප්‍රියතාවය මැනීමට යොදා ගත හැකි මාධ්‍ය වේ.
3.රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ජනතා ප්‍රතිචාරය මැන බැලීමට යොදා ගත හැකි මාධ්‍ය වේ.
4.ජනතා මනස පාලනය කිරීමට ආණ්ඩුවේ භාවිතයට ගත හැකි මාධ්‍යක් වේ.
5.ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක යහපත් පැවැත්ම සඳහා අවශ්‍යම සාධකයක් වේ.

15)නීතිය,

1.රටක ජනතාවගේ බාහිර හැසිරීම පාලනය කරන රෙගුලාසි සමුදායකි.
2.මිනිසුන්ගේ හැඟීම් හා ආවේග නිදහසේ ප්‍රකාශ වීමට අනුබල සපයයි.
3.නීතියේ මූලික අරමුණු සමාන වුවත් නීති රටින් රටට වෙනස් වේ
4. සමාජ පිළිවෙළ හා ස්ථාවරභාවය ඇතිකරයි.
5. සමාජයක පොදු මිනිස් චර්යාවන්ට පටහැනි වන විට පවත්වාගෙන යාම අසීරු වේ.

16)අධිකරණය,

1.නීති පිළිබඳව තීරණ ගැනීමේ නිල බලය පැවරුණු ආණ්ඩුවේ තුන් වෙනි අංගය වේ.
2.ස්වාධීන , අපක්ෂපාතී හා නිර්භය විය යුතු යැයි අපේක්ෂා කෙරේ.
3.විධායකයේ ආශාවන් අනුව ක්‍රියා කළ යුතු යැයි අපේක්ෂා කෙරේ.
4.යුක්තිය හා සාධාරණත්වයේ උත්තරීතර ආයතනය ලෙස සැලකේ.
5.අගවිනිසුරු කෙනකුගේ නායකත්වය යටතේ පහළ සිට ඉහළට උසාවි පද්ධතියක් සංවිධානය කොට ඇත.

17) විධායක බලය ක්‍රියාවට නංවන ආකාරය අනුව ආණ්ඩු වර්ග කර දැක්වීමට අදාළ වන්නේ,
1.කැබිනට් හෙවත් පාර්ලිමේන්තු
2. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී
3.ජනාධිපති
4.මිශ්‍ර විධායක
5. ඒක තන්ත්‍ර

18)ආණ්ඩුව හා මහජනතාව යා කළ හැකි වන්නේ,

1.මැතිවරණ මඟින්
2.ජනමත විචාරණ මඟින්
3. දේශපාලන පක්ෂ මඟින්
4.රාජ්‍ය නොවන සංවිධාන මඟින්
5.බලපෑම් කණ්ඩායම් හා මහජන මතය මඟින්

19)ඒකතන්ත්‍ර පාලන ක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වන්නේ,

1.තනි පුද්ගලයකු අත ඒකරාශී කරන ලද අසහාය බලය
2.පාලකයා නීතියට ඉහළින්ම සිටීම හා ව්‍යවස්ථානුකූල සීමාවන්ගෙන් තොරවීම
3.එක් ක්ෂයක අසහාය නායකත්වය සහිත තරගකාරී පක්ෂ ක්‍රමය
4.හිතුවක්කාරී ලෙස සංවරණයකින් තොරව රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම
5.සමාජීය හා පෞද්ගලික පැවැත්මේ සෑම පැතිකඩක්ම වසා පැතිරුණු දේශපාලනමය පාලනය කිරීම

20)කෝල්බෘාෘක් ප්‍රතිසංස්කරණවල අන්තර්ගත යෝජනා වන්නේ,
1.රාජකාරී ක්‍රමය අහෝසි කිරීම
2.රාජ්‍ය ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීම
3.සිවිල් සේවය ප්‍රතිසංවිධානය කිරීම
4.ස්වාධීන අධිකරණයක් ඇති කිරීම
5.ඉඩම් බදු ක්‍රමය ඒකාකෘතික කිරීම

- අංක 21 සිට 25 දක්වා වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය හෝ ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරන්න.

21) 1910-1924 කාලය තුළ ක්‍රියාවට නැංවූ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ යටතේ,
A. ව්‍යවස්ථාදායක සභාවේ නියෝජිත පදනම පුළුල් කරන ලදී.
B. ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සාමාජික සංඛ්‍යාව අනුක්‍රමයෙන් වැඩි කරන ලදී.
C. ප්‍රාද්ශීය ඡන්ද කොට්ඨාශ යටතේ තෝරා පත් කළ නියෝජිත සංඛ්‍යාව වැඩි කරන ලදී.
D. ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සාමාජිකයින්ගේ බලය වැඩි කරන ලදී.
E. ව්‍යවස්ථාදායක සභාවේ වාර්ගික නියෝජනය මුළුමනින්ම අහෝසි කරන ලදී.

(1) ABCD (2) BCDE (3) ABDE (4)ACDE (5) ABCE

**වී. එස්. එස්. ගුණවර්ධන**
BA,MA,M.Phil(University of Kelaniya) PGDE(University of Colombo)

© THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD. ALL RIGHTS RESERVED.




ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යාපන සේවය සහ දිනමිණ පුවත්පත ඒකාබද්ධව කෙරෙන බුද්ධි ප්‍රබෝධය අධ්‍යාපනික සද්කාරය.

# දේශපාලන විද්‍යාව

- අංක 21 සිට 25 දක්වා වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය හෝ ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරන්න.

21) 1910-1924 කාලය තුළ ක්‍රියාවට නැංවූ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ යටතේ,
A. ව්‍යවස්ථාදායක සභාවේ නියෝජිත පදනම පුළුල් කරන ලදී.
B. ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සාමාජික සංඛ්‍යාව අනුක්‍රමයෙන් වැඩි කරන ලදී.
C. ප්‍රාද්ශීය ඡන්ද කොට්ඨාශ යටතේ තෝරා පත් කළ නියෝජිත සංඛ්‍යාව වැඩි කරන ලදී.
D. ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සාමාජිකයින්ගේ බලය වැඩි කරන ලදී.
E. ව්‍යවස්ථාදායක සභාවේ වාර්ගික නියෝජනය මුළුමනින්ම අහෝසි කරන ලදී.
(1) ABCD (2) BCDE (3) ABDE (4)ACDE (5) ABCE

22. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මඟින් හඳුන්වා දෙන ලද විධායක කාරක සභා ක්‍රමයට අදාළ වන්නේ,
A. ආණ්ඩුකාරවරයාගේ අභිමතය අනුව සාමාජිකයින් පත් කරන ලදී.
B. කතානායකවරයා හා ඡන්දයෙන් තේරිපත්වූ මන්ත්‍රීවරුන්ගෙන් පමණක් සමන්විත විය.
C. රාජ්‍ය මන්ත්‍රණ සභාවෙන් පරිභාහිරව පත් විය.
D. අයවැය ලේඛනය සම්බන්ධයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට සාමුහිකව වගකිව යුතු විය.
E. ඩෝනමෝර් පාලන සමයේ මුල් අවධියේ දී කණ්ඩායම් දෙකක් ලෙස ක්‍රියාත්මක විය.
(1) A හා B (2) Bහා C (3) A හා E (4). C හාD (5) D හා E

23. සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ලක්ෂණයක් වන්නේ,
A. ව්‍යවස්ථාව ලිඛිත වීමය
B. සාපේක්ෂ වශයෙන් අනම්‍ය ව්‍යවස්ථාවක් වීම
C. ව්‍යවස්ථාදායකය ඒකමාණ්ඩලික වීම
D. ලංකා සමාජය බහු වාර්ගික හා බහු ආගමික බව පිළිගැනීම
E. ස්වාධීන අධිකරණ සේවයක් හා රාජ්‍ය සේවයක් ඇති කිරීම
(1) ABC හා D (2) BCD හා E (3) ABD හා E (4)ACD හා E (5) ABC හාE

24. ලංකාවේ ව්‍යවස්ථාදායක සභාවට නියෝජිතයින් තෝරා පත් කර ගැනීමට ප්‍රථමවරට ඡන්ද බලය හඳුන්වා දුන් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය වූයේ,
A. 1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණය
B. 1910 කෲෘව් මැකලම් ප්‍රතිසංස්කරණය
C. 1924 මැනිං - ඩෙවන්ෂයර් ප්‍රතිසංස්කරණය
D. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය
E. 1947 සෝල්බරි ප්‍රතිසංස්කරණය
(1) ABCහා D (2) BCD හා E (3) ABD හා E (4)ACD හා E (5) ABC හා E

25. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව,
A. සුළුජන කණ්ඩායම්වලට රැකවරණය ප්‍රමාණවත්ව සැපයීමට අසමත් විය.
B. මූලික අයිතිවාසිකම් බලාත්මක කිරීමට යාන්ත්‍රණයක් ඇති නොකළේය.
C. සිංහල හා දෙමළ භාෂා රජ්‍ය භාෂා බවට පත් කළේය.
D. රාජ්‍ය සේවය දේශපාලන නායකතත්වයේ ග්‍රහණයෙන් මුදවා ගත්තේය.
E. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් හඳුන්වා දුන්නේය
(1.) A හාB (2.) B හා C (3). C හා D (4). A ,B හා E (5). A,C,D හා E

© THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD ALL RIGHTS RESERVED

- ප්‍රශ්න අංක 26 – 30 දක්වා ඇති ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1) (2) (3) (4) හා (5) යන කවර ප්‍රකාශය දැයි සඳහන් කරන්න.
- වගුව සඳහා යොමුව

| අංකය | ප්‍රකාශය 1 | ප්‍රකාශය 2 |
|---|---|---|
| (1) | සත්‍යය | සත්‍යය |
| (2) | සත්‍යය | අසත්‍යය |
| (3) | අසත්‍යය | සත්‍යය |
| (4) | අසත්‍යය | අසත්‍යය |
| (5) | සත්‍යය | සත්‍යය වන අතර පළමු ප්‍රකාශය නිවැරදිව හදා දෙයි. |

- වගුව

| | ප්‍රකාශය 1 | ප්‍රකාශය 2 |
|---|---|---|
| 26. . | තුලනාත්මක ප්‍රවේශයේදී,සංසන්දනය කිරීම ප්‍රධාන කාර්යය වේ. | තුලනාත්මක ප්‍රවේශයේදී දේශපාලන විග්‍රහය කල යුත්තේ දේශපාලන සංවර්ධනය සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ පරමාදර්ශී මිනුම් දඬු භාවිත කරමින් නොවේ. (........) |
| 27. | නිරාගමිකවාදයේ මූලික හරය වන්නේ මිනිසුන් ආගම් ඇදහීමෙන් ඉවත්විය යුතු බවයි. | රාජ්‍ය ක්ෂේත්‍රයට ආගමේ බලපෑමක් ද ආගමික ක්ෂේත්‍රයට රාජ්‍යයේ බලපෑමක්ද නොමැති විය යුතු බව ඉන් අවධාරණය කරන ලබයි. (.........) |
| 28. | සමුහාණ්ඩුවාදය දේශපාලන සංකල්පයක් ලෙසත් දෘෂ්ටිවාදයක් ලෙසත් සැලකිය හැකිය | සමුහාණ්ඩුවාදයේදී සීමිත බලැති රාජාණ්ඩු සම්බන්ධයෙන් බලවත් විරෝධයක් නොමැත (.........) |
| 29. | අර්ධ ජනාධිපති ආණ්ඩු ක්‍රමයක මූලික ලක්ෂණය ජනතාව තෝරා පත් කරන ජනාධිපතිවරයෙකු මෙන්ම ව්‍යවස්ථාදායකය තුළින් පත් වන අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලයක ද පැවැත්මයි. | අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය ඉවත් කළ හැක්කේ පාර්ලිමේන්තුවේ 2/3 ක බලයෙන් යෝජනාවක් සම්මත කිරීමෙනි. (..........) |
| 30. | 1924 මැනිං ඩෙවෙන්ෂයර් ආණ්ඩුක්රම ප්රතිසංස්කරණයේදී පාර්ලිමේන්තු කැබිනට් සම්ප්රධායේ ආණ්ඩුකමයක් හඳුන්වා දෙන ලදි. | 1924 මැනිං ඩෙවෙන්ෂයර් ආණ්ඩුක්රම ප්රතිසංස්කරණයේදී ආණ්ඩුකාරවරයාට වියවස්ථාදායක සභාව තුළ තිබූ සහතික කරන ලද බහුතරය අහිමි විය. (..........) |

## B කොටස

31. මිනිසාගේ දේශපාලන හැසිරීම් කෙරෙහි බලපාන සාධක දෙකක් නම් කරන්න.

32. දාර්ශනික ප්‍රතිමානීය ප්‍රවේශයේ පුරෝගාමීන් වූ ග්‍රීක දාර්ශනිකයින් දෙදෙනකු නම් කරන්න.

33. ග්‍රීක නාගරික රාජ්‍යයන්හි සෘජු ප්‍රජාතන්ත්‍රවාදය නැතිවීමෙන් පසු නාගරික රාජ්‍යයන් තුළ බිහි වූ පාලන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

34. පශ්චාත් විප්ලවීය සමාජවාදී රාජ්‍යයන්හි ප්‍රකට වී පෙනෙන පොදු ලක්ෂණ දෙකක් දක්වන්න.
35. යුරෝපයේ ප්‍රථම වරට බිහි වූ ජාතික රාජ්‍යයන් දෙකක් සඳහන් කරන්න.

36. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ක්‍රියාත්මක වන රටවල පාලන ව්‍යුහයට අත පොවන අන්තර්ජාතික බලපෑම් කණ්ඩායම් දෙකක් සඳහන් කරන්

37. ඒකීය රාජ්‍යයන්හි මධ්‍යයේ සිට පහළට පරිපාලන බලය විසුරුවා හැරීම ප්‍රධාන වශයෙන් ක්‍රම 3 කි.ඉන් දෙකක් සඳහන් කරන්න.

38. යුරෝපයේ ව්‍යාප්ත වූ ධනේශ්වර ආර්ථික ක්‍රමයේ වර්ධනයට හා විකාශනයට බලපෑ දේශපාලන මතවාදය කුමක්දැයි දක්වා එහි මූලික ප්‍රභේදයක් සඳහන් කරන්න.

39. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම තුළ අන්තර්ගත වී ඇති ගුණාංග දෙකක් දක්වන්න.

40. 1. රාජාණ්ඩුවාදයට එකහෙළා විරුද්ධවීම හා පරමාධිපත්‍ය බලයේ හිමිකරුවා ජනතාව බව අවධාරණය කිරීම
2. රාජ්‍යය වන්දනය හා අත්‍යන්ත රණවාදය

ඉහත ලක්ෂණ නියෝජනය කරන දේශපාලන මතවාද දෙක පිළිවෙළින් නම් කරන්න.

41. චාල්ස් හේ කැමරන්ගේ අධිකරණ ප්‍රතිසංස්කරණ දෙකක් දක්වන්න.

42. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයන්හි අන්තර්ගත වැදගත් යෝජනා දෙකක් දක්වන්න.

43. 1947 සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයට අග්‍රාණ්ඩුකාරවරයා නාමකරණයෙන් සාමාජිකයන් පත් කිරීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.

44. ලංකාව සමුහාණ්ඩුවක් බවට පත්කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ඒ යටතේ නාමික විධායකය හැඳින්වූ නිල නාමය සඳහන් කරන්න

45. 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව තුළ රාජ්‍ය සේවය විධිමත් කිරීම සඳහා ගනු ලැබූ පියවර දෙකක් දක්වන්න.

46. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව බිහිවීම කෙරෙහි බලපෑ පසුබිම් සාධක දෙකක් දක්වන්න.

47. කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වශයෙන් ජනාධිපතිවරයා උසුලනු ලබන වගකීම් 02 ක්

48. 1978 ව්‍යවස්ථාව සංශෝධනය කළ හැකි ක්‍රම දෙක සඳහන් කරන්න.

49. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම පිළිබඳ ප්‍රතිපත්ති චක්‍රයේ මුල් අවධි දෙක පිළිවෙළින් සඳහන් කරන්න.

50. නූතන රාජ්‍යයන්හි විදේශ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා භවිතයට ගන්නා උපක්‍රම දෙකක් නම් කරන්න.

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විතය.
- පළමුවැනි කොටසින් යටත් පිරිසෙයින් **එක්** ප්‍රශ්නයක් ද , දෙවැනි කොටසින් යටත් පිරිසෙයින් ප්‍රශ්න **දෙකක්** ද , තුන්වැනි කොටසින් යටත් පිරිසෙයින් **එක්** ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුර සපයන්න.

## I කොටස

1. දේශපාලනය හා පුරවැසියා අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙක බැඳී පවතී. සාකච්ඡා කරන්න.

2. පහත සඳහන් දේශපාලන අධ්‍යයන ප්‍රවේශ දෙක විස්තර කරන්න.

සමාජ විද්‍යාත්මක ප්‍රවේශය
දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය

3. පහත සඳහන් මාතෘකාවලින් ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.
රාජ්‍යය සතු කාර්යයභාරය
නූතන භෞමික රාජ්‍යය
නව ලිබරල්වාදය
නීතියේ ආධිපත්‍යය

## II කොටස

4. යුරෝපියයන් විසින් ශ්‍රී ලංකාව යටත් විජිත පාලනයට නතු කර ගැනීමෙන් පසු ඇති වූ දේශපාලන ප්‍රතිඵල පහත මාතෘකා දෙක යටතේ පැහැදිලි කරන්න.

ව්‍යවස්ථානුකූල පාලනය
නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය

5. 1947 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලතල සාකච්ඡා කරන්න.
6.
1978 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පහත මාතෘකා පිළිබඳ ඔබේ අදහස් දක්වන්න
විධායක ජනාධිපතිගේ බලතල හා කාර්යයන්
මූලික අයිතිවාසිකම් හා නන් වැදෑරුම් නිදහස

7. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ විශේෂත්වය සාකච්ඡා කරන්න.

## III කොටස

8. ඉන්දිය සන්ධීය ක්‍රමය ඇමෙරිකානු සන්ධීය ක්‍රමයෙන් වෙනස්වන ආකාරය පහදන්න.

9. ශ්‍රී ලංකාවේ පක්ෂ ක්‍රමයේ නව ප්‍රවණතා මොනවාද?

10. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.

ගැටුම් නිරාකරණය
එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආයතනික ව්‍යුහය හා ක්‍රියාකාරීත්වය
ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය
රාජ්‍ය පරිපාලනය

**වී. එස්. එස්. ගුණවර්ධන**
BA,MA,M.Phil(University of Kelaniya) PGDE(University of Colombo)